030575

AL/2026/02/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | | |
|---|---|---|
| රසායන විද්‍යාව I<br>இரசாயனவியல் I<br>Chemistry I | 02 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

- ※ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **09** කින් යුක්ත වේ.
- ※ **10** වෙනි පිටුවේ මුද්‍රණය කර ඇති ආවර්තිතා වගුව අවශ්‍ය නම් වෙන් කරගන්න.
- ※ **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- ※ පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත්ව කියවන්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගෙන, එය **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ \text{J K}^{-1}\ \text{mol}^{-1}$
ඇවගාඩ්රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ \text{mol}^{-1}$
ප්ලෑන්ක්ගේ නියතය $h = 6.626 \times 10^{-34}\ \text{J s}$
ආලෝකයේ ප්‍රවේගය $c = 3 \times 10^{8}\ \text{m s}^{-1}$

**1.** හයිඩ්‍රජන් විමෝචන වර්ණාවලියේ බාමර් ශ්‍රේණියේ රේඛා ලබා දෙන ඉලෙක්ට්‍රෝන සංක්‍රමණය වන ශක්ති මට්ටම් දැක්වෙනුයේ, ($n$ = ප්‍රධාන ක්වොන්ටම් අංකය)

(1) $n > 1$ සිට $n = 1$
(2) $n = 2$ සිට $n > 2$
(3) $n > 3$ සිට $n = 3$
(4) $n > 2$ සිට $n = 2$
(5) $n < 2$ සිට $n = 2$

**2.** භූමි අවස්ථාවේ පවතින නයිට්‍රජන් පරමාණුවක පිටතින්ම පිහිටා ඇති $p$ ඉලෙක්ට්‍රෝන, ක්වොන්ටම් අංක $n = 2$ සහ $l = 1$ මගින් දැක්විය හැක. හුන්ඩ්ගේ නියමය අනුව මෙම ඉලෙක්ට්‍රෝන දෙකක $m_l$ සහ $m_s$ ක්වොන්ටම් අංක විය හැක්කේ,

| | **ඉලෙක්ට්‍රෝනය 1** | | **ඉලෙක්ට්‍රෝනය 2** |
|---|---|---|---|
| (1) | $m_l = +1$ , $m_s = +\frac{1}{2}$ | සහ | $m_l = +1$ , $m_s = +\frac{1}{2}$ |
| (2) | $m_l = +1$ , $m_s = +\frac{1}{2}$ | සහ | $m_l = -1$ , $m_s = -\frac{1}{2}$ |
| (3) | $m_l = 0$ , $m_s = +\frac{1}{2}$ | සහ | $m_l = +1$ , $m_s = +\frac{1}{2}$ |
| (4) | $m_l = 0$ , $m_s = +\frac{1}{2}$ | සහ | $m_l = -1$ , $m_s = -\frac{1}{2}$ |
| (5) | $m_l = +1$ , $m_s = -\frac{1}{2}$ | සහ | $m_l = 0$ , $m_s = +\frac{1}{2}$ |

**3.** $Cl^-$, Ar සහ $K^+$ යන ප්‍රභේද සලකන්න. මෙම ප්‍රභේද පිළිබඳ සත්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) මේවාට එකම පරමාණුක/අයනික ස්කන්ධයක් ඇත.
(2) මේවාට එකම පරමාණුක/අයනික අරයක් ඇත.
(3) මේවාට එකම පරමාණුක ක්‍රමාංකයක් ඇත.
(4) එක් එක් ප්‍රභේදයේ පිටතම ඉලෙක්ට්‍රෝනයකට දැනෙන සඵල න්‍යෂ්ටික ආරෝපණය සමාන වේ.
(5) මේවාට සමාන $p$ ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාවක් ඇත.

**4.** Xe හා එහි සංයෝග පිළිබඳව පහත සඳහන් ප්‍රකාශවලින් **අසත්‍ය** කුමක් ද?


(1) ආවර්තිතා වගුවේ 18 වන කාණ්ඩයේ He සිට Xe දක්වා මූලද්‍රව්‍ය අතුරෙන් Xe වලට ඉහළම තාපාංකය ඇත.
(2) ආවර්තිතා වගුවේ 18 කාණ්ඩයේ මූලද්‍රව්‍යවලින් වැඩිම පළමු අයනීකරණ ශක්තිය ඇත්තේ Xe වලට ය.
(3) $XeF_4$ සහ $XeF_6$ හි Xe හි ඔක්සිකරණ අංක පිළිවෙළින් +4 සහ +6 වේ.
(4) $XeF_2$ ත්‍රිආනති ද්විපිරමීඩාකාර ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතියක් පෙන්වයි.
(5) ආවර්තිතා වගුවේ 18 කාණ්ඩයේ මුල් මූලද්‍රව්‍ය පහ අතුරෙන් Xe හි පරමාණුක අරය වැඩිම වේ.

03030000720110575

[දෙවැනි පිටුව බලන්න.

**5.** රූපයෙහි දක්වා ඇති **A, B** සහ **C** වක්‍රයන්, සංවෘත පද්ධතියක් තුළ සිදුවන පහත දැක්වෙන වායු කලාපීය ප්‍රතික්‍රියාවෙහි අඩංගු වන ප්‍රභේදයන්හි සාන්ද්‍රණ වෙනස්වීම් පෙන්වයි.

$$O_2(g) + 2H_2(g) \longrightarrow 2H_2O(g)$$




පිළිවෙළින් $O_2(g)$, $H_2(g)$ සහ $H_2O(g)$ ප්‍රභේදයන්හි නිවැරදි නියෝජනය වන්නේ,

(1) **A, B, C** (2) **B, A, C** (3) **B, C, A** (4) **C, A, B** (5) **C, B, A**

**6.** පහත සඳහන් ප්‍රකාශවලින් සෝඩියම් සහ පොටෑසියම් පිළිබඳ නිවැරදි වන්නේ කුමක් ද?

(1) වාතයේ දහනය කළ විට සෝඩියම් සහ පොටෑසියම් යන දෙකම ප්‍රධාන ඵලය ලෙස ඒවායේ පෙරොක්සයිඩ සාදයි.
(2) සෝඩියම් සහ පොටෑසියම් යන දෙකෙහිම ජලය සමග ප්‍රතික්‍රියාව තාපදායක වේ.
(3) සෝඩියම් සහ පොටෑසියම් යන දෙකම $H_2(g)$ සමග ප්‍රතික්‍රියා කර ඒවායේ හයිඩ්‍රොක්සයිඩ සාදයි.
(4) පොටෑසියම් වායුමය $N_2$ සමග ප්‍රතික්‍රියා නොකරන අතර සෝඩියම්, $N_2$ සමග ප්‍රතික්‍රියා කර එහි නයිට්‍රයිඩය සාදයි.
(5) සෝඩියම් සහ පොටෑසියම් යන දෙකෙහිම තනුක ඛනිජ අම්ල සමග ප්‍රතික්‍රියාව තාප අවශෝෂක වේ.

**7.** පහත ඇති **A** සිට **E** දක්වා සංයෝග සලකන්න.

| $CH_3CH_2CHO$ | $CH_3CH_2CH_2CHO$ | $CH_3CH_2CH_2OH$ | $CH_3CH_2CH_2CH_2OH$ | $CH_3CH(OH)CH_2CH_3$ |
|---|---|---|---|---|
| **A** | **B** | **C** | **D** | **E** |


අඩුම ජලීය ද්‍රාව්‍යතාවයක් ඇති සංයෝගය වනුයේ,

(1) **A** (2) **B** (3) **C** (4) **D** (5) **E**

**8.** පහත සඳහන් කුමක් **වැරදි** වේ ද?

(1) $NH_3(aq)/NH_4Cl(aq)$ මිශ්‍රණයක දී ඇති පරිමාවකට 0.10 mol dm$^{-3}$ HCl(aq) සුළු ප්‍රමාණයක් එකතු කළ විට පද්ධතියෙහි pH අගය ආසන්නව 9 සිට 1 දක්වා පහත වැටේ.
(2) දී ඇති $H_2O(l)$ පරිමාවකට 0.10 mol dm$^{-3}$ NaOH(aq) බිංදු වශයෙන් එකතු කළ විට පද්ධතියෙහි pH අගය ආසන්නව, 7 සිට 12 දක්වා වේගයෙන් වැඩි වේ.
(3) $CH_3COOH(aq)/CH_3COONa(aq)$ මිශ්‍රණයක දී ඇති පරිමාවකට 0.10 mol dm$^{-3}$ NaOH(aq) සුළු ප්‍රමාණයක් එකතු කළ විට pH අගයෙහි වෙනස් වීම නොසලකා හැරිය හැක.
(4) $CH_3COOH(aq)/CH_3COONa(aq)$ මිශ්‍රණයක දී ඇති පරිමාවකට 0.10 mol dm$^{-3}$ NaOH(aq) සුළු ප්‍රමාණයක් එකතු කළ විට,
$OH^-(aq) + CH_3COOH(aq) \longrightarrow CH_3COO^-(aq) + H_2O(l)$ ප්‍රතික්‍රියාව සිදු වේ.
(5) දී ඇති 0.10 mol dm$^{-3}$ $NH_3(aq)$ ද්‍රාවණ පරිමාවකට 0.10 mol dm$^{-3}$ HCl(aq) බිංදු වශයෙන් එකතු කළ විට pH අගය ආසන්නව 11 සිට 2 දක්වා වෙනස් වේ.


**9.** දී ඇති සංයෝගයේ IUPAC නාමය කුමක් ද?



(1) 5-hydroxy-4-bromohex-2-enoic acid
(2) 4-bromo-5-hydroxyhex-4-enoic acid
(3) 4-bromo-5-hydroxyhex-2-enoic acid
(4) 3-bromo-2-hydroxyhex-4-enoic acid
(5) 5-hydroxy-4-bromohex-4-enoic acid

[තුන්වැනි පිටුව බලන්න.

**10.** සංවෘත භාජනයක් තුළ 1 atm නියත පීඩනයක් යටතේ, දී ඇති ජල ස්කන්ධයක සාම්පලයක් ඝන අවස්ථාවෙන් ආරම්භ කර රත් කිරීමේදී සිදුවන උෂ්ණත්ව වෙනස පහත රූපයේ පෙන්වා ඇත.




පහත සඳහන් කුමක් **A**, **B**, **C**, **D**, **E** ලෙස දක්වා ඇති පරාසයන්හි පවතින ජලයේ කලාපවල හෝ කලාප සමතුලිතතා නිවැරදි නියෝජනය දක්වයි ද? මෙම ක්‍රියාවලිය අතරතුර ස්කන්ධ හානියක් සිදු නොවූ බව උපකල්පනය කරන්න.

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| (1) | $H_2O(l)$ | $H_2O(s)$ | $H_2O(s) \rightleftharpoons H_2O(l)$ | $H_2O(g)$ | $H_2O(l) \rightleftharpoons H_2O(g)$ |
| (2) | $H_2O(s) \rightleftharpoons H_2O(l)$ | $H_2O(s)$ | $H_2O(s) \rightleftharpoons H_2O(l)$ | $H_2O(g)$ | $H_2O(l) \rightleftharpoons H_2O(g)$ |
| (3) | $H_2O(s)$ | $H_2O(s) \rightleftharpoons H_2O(l)$ | $H_2O(g)$ | $H_2O(l) \rightleftharpoons H_2O(g)$ | $H_2O(g)$ |
| (4) | $H_2O(l)$ | $H_2O(s) \rightleftharpoons H_2O(l)$ | $H_2O(s)$ | $H_2O(l) \rightleftharpoons H_2O(g)$ | $H_2O(g)$ |
| (5) | $H_2O(s)$ | $H_2O(s) \rightleftharpoons H_2O(l)$ | $H_2O(l)$ | $H_2O(l) \rightleftharpoons H_2O(g)$ | $H_2O(g)$ |

**11.** ශිෂ්‍යයෙක්, විද්‍යාගාරයේ බෝතලයක තිබූ, සූත්‍රය $Fe(NH_4)_2(SO_4)_2 \cdot 6H_2O$ වන සංයෝගයක්, **0.005 mol dm$^{-3}$** $Fe^{2+}$ අයන ජලීය ද්‍රාවණයකින් 250.00 cm$^3$ක් පිළියෙළ කිරීම සඳහා භාවිත කරයි. බෝතලයේ තිබූ ලේබලය, සංයෝගයේ සංශුද්ධතාවය 80% බව පෙන්නුම් කරයි. ද්‍රාවණය පිළියෙළ කිරීමට අවශ්‍ය සංයෝගයේ ස්කන්ධය වනුයේ, (H = 1, N = 14, O = 16, S = 32 සහ Fe = 56)

(1) 6.125 g (2) 1.96 g (3) 0.6125 g (4) 0.490 g (5) 0.392 g

**12.** ක්ලෝරීන්හි ඔක්සො ඇනායන පිළිබඳ පහත සඳහන් ප්‍රකාශවලින් **අසත්‍ය** වනුයේ කුමක් ද?

(1) $ClO_2^-$, $ClO_3^-$ සහ $ClO_4^-$ වල ලුවිස් තිත්-ඉරි ව්‍යුහවල ඔක්සිජන්-ක්ලෝරීන් ද්විත්ව බන්ධන පිළිවෙළින් එකක්, දෙකක් සහ තුනක් අඩංගු වේ.


(2) $ClO_2^-$, $ClO_3^-$ සහ $ClO_4^-$ හි ක්ලෝරීන්වල ඔක්සිකරණ අංක පිළිවෙළින් +3, +5 සහ +7 වේ.

(3) $ClO_2^-$ ට ඇත්තේ කෝණික හැඩයකි.


(4) $ClO^-$ හි ව්‍යුහයේ O—Cl ද්විත්ව බන්ධනයක් ඇත.

(5) $ClO_3^-$ හි Cl වටා ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය චතුස්තලීය වේ.


**13.** යම් ද්‍රව්‍යයක් රත් කළ විට එහි අවස්ථාව ඝන → ද්‍රව → වායු ලෙස වෙනස් වීමේදී එහි එන්ට්‍රොපියෙහි හැසිරීම පහත සඳහන් කුමන ප්‍රස්තාරයෙන් දක්වයි ද?




(1)




(2)



(3)



(4)




(5)

**14.** දී ඇති උෂ්ණත්වයකදී දෘඪ-සංවෘත බඳුනක් තුළ පවතින පහත සමතුලිතතාවය සලකන්න. M ලෝහයකි.


$$MO(s) + H_2(g) \rightleftharpoons M(s) + H_2O(g)$$

වැඩිපුර MO(s) පවත්වා ගනිමින් වෙනස් ආරම්භක $H_2(g)$ සාන්ද්‍රණයන් සමග පරීක්ෂණ ශ්‍රේණියක් සිදු කරන ලදී. පහත සඳහන් කුමන ප්‍රස්තාරයක් මගින් $H_2(g)$ හි ආරම්භක සාන්ද්‍රණය සමග $H_2O(g)$ හි සමතුලිත සාන්ද්‍රණයේ වෙනස්වීම නිරූපණය කරයි ද?


$H_2(g)$ හි ආරම්භක සාන්ද්‍රණය $= [H_2(g)]_i$
$H_2O(g)$ හි සමතුලිත සාන්ද්‍රණය $= [H_2O(g)]_{eq}$






**15.** පහත සඳහන් ප්‍රතික්‍රියා පටිපාටිය සලකන්න.






ඉහත දී තිබෙන ප්‍රතික්‍රියා පටිපාටියේ **X** සහ **Y** වල ව්‍යුහ පිළිවෙළින්,

(1) 

(2) 


(3) 

(4) 

(5) 

**16.** පහත පෙන්වා ඇති පරිදි A හා B දෘඪ බඳුන් දෙක කරාමයකින් සම්බන්ධ කර ඇත. ආරම්භයේදී A බඳුනෙහි පරිපූර්ණ වායුවක් පුරවා ඇති අතර B බඳුන හිස්ව පවතී. කරාමය විවෘත කළ විට පද්ධතියෙහි එන්ට්‍රොපියෙහි සහ ගිබ්ස් යෝජ්‍ය ශක්තියෙහි වෙනස් වීම කෙසේවේදැයි පුරෝකථනය කරන්න. (උෂ්ණත්වය වෙනස් **නොවන** බව සලකන්න.)

| | **එන්ට්‍රොපිය** | **ගිබ්ස් යෝජ්‍ය ශක්තිය** |
|---|---|---|
| (1) | වැඩි වේ | වැඩි වේ |
| (2) | අඩු වේ | අඩු වේ |
| (3) | වැඩි වේ | අඩු වේ |
| (4) | වැඩි වේ | වෙනස් නොවේ |
| (5) | අඩු වේ | වෙනස් නොවේ |



**17.** දී ඇති උෂ්ණත්වයකදී සංවෘත බඳුනක් තුළ $2X(g) + Y(g) \longrightarrow Z(g)$ යන මූලික ප්‍රතික්‍රියාව සිදුවේ. $X(g)$ හි ආරම්භක සාන්ද්‍රණය දෙගුණයක් සහ $Y(g)$ හි ආරම්භක සාන්ද්‍රණය තෙගුණයක් කළේ නම්, කුමන ගුණාකාරයකින් ප්‍රතික්‍රියාවෙහි ශීඝ්‍රතාවය වැඩි වේ ද?

(1) 5 (2) 6 (3) 12 (4) 18 (5) 24

030575

**18.** පහත ප්‍රතික්‍රියා සලකන්න.

$$4NH_3(g) + 5O_2(g) \longrightarrow 4NO(g) + 6H_2O(l) \quad : \Delta G^\circ_{rxn} = -1010 \text{ kJ mol}^{-1}$$

$$2NO_2(g) \longrightarrow 2NO(g) + O_2(g) \quad : \Delta G^\circ_{rxn} = 70 \text{ kJ mol}^{-1}$$

$$4NO_2(g) + O_2(g) + 2H_2O(l) \longrightarrow 4HNO_3(aq) \quad : \Delta G^\circ_{rxn} = -170 \text{ kJ mol}^{-1}$$


$4NH_3(g) + 8O_2(g) \longrightarrow 4HNO_3(aq) + 4H_2O(l)$ ප්‍රතික්‍රියාවෙහි $\Delta G^\circ$ kJ mol$^{-1}$ වලින් වන්නේ,

(1) −1320 (2) −1250 (3) −1100 (4) −1040 (5) 1100


**19.** වැඩිපුර තනුක HCl එකතු කළ විට පැහැදිලි ද්‍රාවණයක් ලබාදෙමින්, ආම්ලිකෘත $K_2Cr_2O_7$ වලින් පෙඟවූ පෙරහන් කඩදාසියක් කොළ පැහැ ගන්වන වායුවක් පිට කරනුයේ, පහත දක්වා ඇති කුමන ඝන සංයෝගය ද?


(1) $ZnBr_2$ (2) $Ag_2CO_3$ (3) $Na_2S_2O_3$ (4) $SrSO_3$ (5) $Cr(OH)_3$


**20.** පහත දක්වා ඇති ප්‍රතික්‍රියාව සලකන්න.






සෑදෙන ඵලය වනුයේ,

(1)



(2)



(3)



(4)



(5)



**21.** $\frac{1}{2}A_2(g) + \frac{1}{2}B_2(g) \longrightarrow AB(g)$ ප්‍රතික්‍රියාව සලකන්න.

$A_2(g)$, $B_2(g)$ සහ $AB(g)$ හි බන්ධන විඝටනයේ එන්තැල්පි අගයන්හි අනුපාතය 2 : 1 : 2 වේ. මෙම ප්‍රතික්‍රියාවේ එන්තැල්පි වෙනස −100 kJ mol$^{-1}$ වේ. $A_2(g)$ හි බන්ධන විඝටනයේ එන්තැල්පි අගය kJ mol$^{-1}$ වලින් වන්නේ,

(1) 100 (2) 300 (3) 350 (4) 400 (5) 450


**22.** 25 °C දී, $Pt(s) \mid Fe^{2+}(aq), Fe^{3+}(aq)$ සහ $Pt(s) \mid Mn^{2+}(aq), H^+(aq), MnO_4^-(aq)$ අර්ධ කෝෂ භාවිතයෙන් විද්‍යුත් රසායනික කෝෂයක් ගොඩනගන ලදි. මෙම කෝෂය සඳහා 25 °C දී පහත සඳහන් කුමක් නිවැරදි වේ ද?

$$E^\circ_{Fe^{3+}(aq)/Fe^{2+}(aq)} = +0.77 \text{ V}, \quad E^\circ_{MnO_4^-(aq)/Mn^{2+}(aq)} = +1.51 \text{ V}$$

| | ඇනෝඩය | කැතෝඩය | කෝෂ අංකනය | වි.ගා.බ./V |
|---|---|---|---|---|
| (1) | $Fe^{3+}(aq) \mid Fe^{2+}(aq)$ | $MnO_4^-(aq) \mid Mn^{2+}(aq)$ | $Pt(s) \mid Fe^{2+}(aq), Fe^{3+}(aq) \parallel MnO_4^-(aq), H^+(aq), Mn^{2+}(aq) \mid Pt(s)$ | −0.74 |
| (2) | $Fe^{3+}(aq) \mid Fe^{2+}(aq)$ | $MnO_4^-(aq) \mid Mn^{2+}(aq)$ | $Pt(s) \mid Fe^{2+}(aq), Fe^{3+}(aq) \parallel MnO_4^-(aq), H^+(aq), Mn^{2+}(aq) \mid Pt(s)$ | +0.74 |
| (3) | $MnO_4^-(aq) \mid Mn^{2+}(aq)$ | $Fe^{3+}(aq) \mid Fe^{2+}(aq)$ | $Pt(s) \mid Fe^{2+}(aq), Fe^{3+}(aq) \parallel MnO_4^-(aq), H^+(aq), Mn^{2+}(aq) \mid Pt(s)$ | +0.74 |
| (4) | $Fe^{3+}(aq) \mid Fe^{2+}(aq)$ | $MnO_4^-(aq) \mid Mn^{2+}(aq)$ | $Pt(s) \mid Mn^{2+}(aq), H^+(aq), MnO_4^-(aq) \parallel Fe^{3+}(aq), Fe^{2+}(aq) \mid Pt(s)$ | +0.74 |
| (5) | $Fe^{3+}(aq) \mid Fe^{2+}(aq)$ | $MnO_4^-(aq) \mid Mn^{2+}(aq)$ | $Pt(s) \mid Mn^{2+}(aq), H^+(aq), MnO_4^-(aq) \parallel Fe^{3+}(aq), Fe^{2+}(aq) \mid Pt(s)$ | −0.74 |

01030000720110575

**23.** පහත දක්වා ඇති සංයෝග සලකන්න.




**A** **B** **C**

මෙම සංයෝගවල ෆ්‍රීඩල්-ක්‍රාෆ්ට්ස් (Friedel-Crafts) ඇසයිලීකරණයේ පහසුතාවය වැඩිවන පිළිවෙළ වනුයේ,

(1) **A < B < C** (2) **A < C < B** (3) **B < A < C** (4) **B < C < A** (5) **C < B < A**

**24.** උත්ප්‍රේරකයක් හමුවේ සිදුවන ප්‍රතික්‍රියාවක යන්ත්‍රණයෙහි පියවර පහත දක්වා ඇත.

පියවර I : $Ag^{+}(aq) + Ce^{4+}(aq) \longrightarrow Ag^{2+}(aq) + Ce^{3+}(aq)$

පියවර II : $Tl^{+}(aq) + Ag^{2+}(aq) \longrightarrow Tl^{2+}(aq) + Ag^{+}(aq)$

පියවර III : $Tl^{2+}(aq) + Ce^{4+}(aq) \longrightarrow Tl^{3+}(aq) + Ce^{3+}(aq)$

පහත සඳහන් කුමක්, සමස්ත ප්‍රතික්‍රියාව, උත්ප්‍රේරකය සහ අතරමැදිය/අතරමැදියන් නිවැරදිව හඳුන්වා දේ ද?

| | **සමස්ත ප්‍රතික්‍රියාව** | **උත්ප්‍රේරකය** | **අතරමැදිය/අතරමැදියන්** |
|---|---|---|---|
| (1) | $2Ce^{4+}(aq) + Tl^{+}(aq) \longrightarrow 2Ce^{3+}(aq) + Tl^{3+}(aq)$ | $Ag^{+}(aq)$ | $Ag^{2+}(aq)$, $Tl^{2+}(aq)$ |
| (2) | $2Ce^{4+}(aq) + Tl^{+}(aq) \longrightarrow 2Ce^{3+}(aq) + Tl^{3+}(aq)$ | $Tl^{2+}(aq)$ | $Ag^{2+}(aq)$ |
| (3) | $Ce^{4+}(aq) + Tl^{+}(aq) \longrightarrow Tl^{2+}(aq) + Ce^{3+}(aq)$ | $Ag^{+}(aq)$ | $Ag^{2+}(aq)$ |
| (4) | $Ce^{4+}(aq) + Tl^{+}(aq) \longrightarrow Tl^{2+}(aq) + Ce^{3+}(aq)$ | $Ag^{2+}(aq)$ | $Ag^{+}(aq)$ |
| (5) | $Ce^{4+}(aq) + Tl^{2+}(aq) \longrightarrow Tl^{3+}(aq) + Ce^{3+}(aq)$ | $Ag^{+}(aq)$ | $Ag^{2+}(aq)$, $Tl^{+}(aq)$ |

**25.** පහත සඳහන් ප්‍රකාශවලින් කුමක් **වැරදි** වේ ද?

(1) දී ඇති උෂ්ණත්වයකදී දෘඪ-සංවෘත බඳුනක් තුළ පවතින වායුමය සමතුලිත පද්ධතියකට නිෂ්ක්‍රිය වායුවක් එකතු කළ විට පද්ධතියේ මුළු පීඩනය වැඩි වන අතර සමතුලිතතා නියතය නොවෙනස්ව පවතී.

(2) දී ඇති උෂ්ණත්වයකදී සුනම්‍ය-සංවෘත බඳුනක් තුළ පවතින වායුමය සමතුලිත පද්ධතියක මුළු පීඩනය නියතව තබා ගනිමින් නිෂ්ක්‍රිය වායුවක් එකතු කළ විට සමතුලිතතා නියතය නොවනස්ව පවතී.

(3) දී ඇති උෂ්ණත්වයකදී දෘඪ-සංවෘත බඳුනක් තුළ පවතින $2HgO(s) \rightleftharpoons 2Hg(l) + O_2(g)$ සමතුලිත පද්ධතියෙහි පීඩනය වැඩි කළ විට සමතුලිතතා ලක්ෂ්‍ය දකුණු දෙසට යොමු වේ.

(4) නියත උෂ්ණත්වයකදී සුනම්‍ය-සංවෘත බඳුනක් තුළ පවතින $2SO_2(g) + O_2(g) \rightleftharpoons 2SO_3(g)$ සමතුලිත පද්ධතියෙහි $SO_3(g)$ ඵලදාව වැඩි කිරීමට බාහිර පීඩනයක් යෙදීමෙන් බඳුනෙහි පරිමාව අඩු කළ යුතු ය.

(5) නියත උෂ්ණත්වයකදී දෘඪ-සංවෘත බඳුනක් තුළ පවතින $C(s) + 2H_2(g) \rightleftharpoons CH_4(g)$ සමතුලිත පද්ධතියෙහි පීඩනය වැඩි කළ විට ඉදිරි ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාවය වැඩි වේ.

**26.** 25 °C හා 100 °C දී $Mg(OH)_2(s)$ හි ජලයෙහි ද්‍රාව්‍යතාවය පිළිවෙළින් $1.0 \times 10^{-4}$ mol $dm^{-3}$ සහ $4.0 \times 10^{-3}$ mol $dm^{-3}$ වේ. 100 °C හි පවතින $Mg(OH)_2$ ද්‍රාවණයක $OH^{-}(aq)$ සාන්ද්‍රණය සහ pH අගය, 25 °C පවතින ද්‍රාවණයකින් කෙසේ වෙනස් වේ ද?


25 °C දී $K_w = 1.0 \times 10^{-14}$ $mol^2$ $dm^{-6}$ සහ 100 °C දී $K_w = 5.5 \times 10^{-14}$ $mol^2$ $dm^{-6}$ වේ.

| | **$[OH^{-}(aq)]$** | **pH** |
|---|---|---|
| (1) | වැඩි ය | වෙනසක් නැත |
| (2) | වැඩි ය | වැඩි ය |
| (3) | වෙනසක් නැත | වැඩි ය |
| (4) | අඩු ය | අඩු ය |
| (5) | වැඩි ය | අඩු ය |

**27.** 2,4-ඩයිනයිට්‍රෝෆීනයිල්හයිඩ්‍රසීන් (2,4-DNP) සමග වර්ණවත් අවක්ෂේපයක් ලබාදෙන සහ ව්‍යුහයේ බෙන්සීන් වලයක් ඇති, අණුක සූත්‍රය $C_8H_8O$ වන සමාවයවික සංයෝග කොපමණ සංඛ්‍යාවක් පවතී ද?

(1) 2 (2) 3 (3) 4 (4) 5 (5) 6

**28.** එක්තරා උෂ්ණත්වයකදී දෘඪ-සංවෘත බඳුනක් තුළ $MCO_3(s)$ ලෝහ කාබනේටය, $MO(s)$ සහ $CO_2(g)$ බවට වියෝජනය වීම සඳහා සිදු කරන ලද පරීක්ෂණ කිහිපයක් අනුසාරයෙන් දී ඇති ප්‍රස්තාරය ලබාගන්නා ලදි. ආරම්භක $MCO_3(s)$ ප්‍රමාණය වෙනස් කරමින් $CO_2(g)$ සාන්ද්‍රණ මැන ගන්නා ලදි.




මෙම පද්ධතිය පිළිබඳව පහත ප්‍රකාශ අතුරෙන් කුමක් **වැරදි** වේ ද? $K$ යනු සමතුලිතතා නියතය හා $Q$ යනු ප්‍රතික්‍රියා ලබ්ධිය වේ.

(1) **A** ලක්ෂ්‍යයෙන් පසු පමණක් $MCO_3(s) \rightleftharpoons MO(s) + CO_2(g)$ සමතුලිතතාවය ස්ථාපනය වේ.
(2) **B** ලක්ෂ්‍යයේදී $Q > K$ වේ.
(3) **C** ලක්ෂ්‍යයේදී $Q < K$ වේ.
(4) **A** ලක්ෂ්‍යයෙන් පසු පද්ධතියෙහි පීඩනය වෙනස් නොවේ.
(5) **B** හා **C** ලක්ෂ්‍ය දෙකෙහිදීම $Q = K$ වේ.

**29.** ජලය සමග ලෝහමය සෝඩියම්වල ප්‍රතික්‍රියාව අප්‍රතිවර්ත්‍ය වේ. ලෝහමය Na 460.0 g ට, සංශුද්ධ ජලය 1.80 g ප්‍රවේශමෙන් එකතු කරන ලදි. සැදෙන උපරිම $H_2$ වායු ප්‍රමාණය මවුලවලින් වනුයේ,
(H = 1, O = 16 සහ Na = 23)

(1) 20 (2) 10 (3) 0.20 (4) 0.10 (5) 0.05

**30.** $CaCO_3$ සහ $ZnCO_3$ 1:1 ස්කන්ධ අනුපාතයකින් අඩංගු මිශ්‍රණයක ඝන සාම්පලයකට තනුක HCl එකතු කළ විට පැහැදිලි ද්‍රාවණයක් ලැබුණි. අවසන් ද්‍රාවණයේ $Ca^{2+} : Zn^{2+}$ මවුල අනුපාතය ආසන්නව වනුයේ,
(C = 12, O = 16, Ca = 40 සහ Zn = 65)

(1) 1 : 1 (2) 5 : 4 (3) 4 : 5 (4) 2 : 1 (5) 1 : 2

● අංක **31** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (*a*), (*b*), (*c*) සහ (*d*) යන ප්‍රතිචාර හතර අතුරෙන්, එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය/ප්‍රතිචාර කවරේ දැ'යි තෝරා ගන්න.


(*a*) සහ (*b*) පමණක් නිවැරදි නම් (1) මත ද
(*b*) සහ (*c*) පමණක් නිවැරදි නම් (2) මත ද
(*c*) සහ (*d*) පමණක් නිවැරදි නම් (3) මත ද
(*d*) සහ (*a*) පමණක් නිවැරදි නම් (4) මත ද
**වෙනත්** ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් (5) මත ද

පිළිතුරු පත්‍රයෙහි දැක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න.

**ඉහත උපදෙස් සම්පිණ්ඩනය**

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| (*a*) සහ (*b*) පමණක් නිවැරදියි | (*b*) සහ (*c*) පමණක් නිවැරදියි | (*c*) සහ (*d*) පමණක් නිවැරදියි | (*d*) සහ (*a*) පමණක් නිවැරදියි | **වෙනත්** ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදියි |

**31.** සම්මත හයිඩ්‍රජන් ඉලෙක්ට්‍රෝඩය පිළිබඳව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේ ද?
(*a*) ඉලෙක්ට්‍රෝඩයෙහි $E^{\circ}$ අගය 0.00 V ලෙස සලකනු ලැබේ.
(*b*) අර්ධ ප්‍රතික්‍රියාව අප්‍රතිවර්ත්‍ය වේ.
(*c*) අර්ධ ප්‍රතික්‍රියාව සැමවිටම ස්වයංසිද්ධ වේ.
(*d*) සලකනු ලබන විද්‍යුත් රසායනික කෝෂය අනුව එයට ඇනෝඩය හෝ කැතෝඩය ලෙස ක්‍රියා කළ හැක.

**32.** ඇසිටෝන් සමග 2,4-ඩයිනයිට්‍රොෆීනයිල්හයිඩ්‍රසීන් (2,4-DNP) ප්‍රතික්‍රියාව සම්බන්ධව, පහත සඳහන් කුමන වගන්තිය/වගන්ති නිවැරදි වේ ද?
(*a*) මෙය පියවර දෙකකින් සිදුවන ප්‍රතික්‍රියාවක් වන අතර දෙවන පියවර විජලන ප්‍රතික්‍රියාවකි.
(*b*) මෙම ප්‍රතික්‍රියාවේදී පළමුවන පියවරෙහිදී සැදෙන ඵලය වෙන් කර ගැනීමට හැකි ය.
(*c*) මෙම ප්‍රතික්‍රියාවේදී සැදෙන වර්ණවත් ඵලයේ ව්‍යුහය  වේ.

(*d*) ඇසිටෝන්, ඇසිටික් අම්ලයෙන් වෙන් කර හඳුනාගැනීමට මෙම ප්‍රතික්‍රියාව භාවිත කළ හැක.

**33.** සබන් යනු මේද අම්ලවල සෝඩියම් හෝ පොටෑසියම් ලවණයකි. කඨින ජලය සහ සබන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ හඳුනාගන්න.

(*a*) සබන්වල පිරිසිදු කිරීමේ හැකියාව සංශුද්ධ ජලයේදීට වඩා කඨින ජලයේදී වැඩි ය.

(*b*) බහුසංයුජ කැටායන සබන් සමග ප්‍රතික්‍රියාවෙන් සෑදෙන අවක්ෂේප ජලයට වඩා ඝනත්වයෙන් වැඩි ය.

(*c*) මේද අම්ලවල ඇනායන බහුසංයුජ කැටායනයකට ආකර්ෂණය වීමෙන් අවක්ෂේපයක් සෑදේ.

(*d*) $Ca^{2+}$, $Mg^{2+}$ සහ $Fe^{2+}$ කඨින ජලයේ ඇති සමහරක් බහුසංයුජ කැටායන වේ.

**34.** නයිට්‍රජන්වල රසායනය පිළිබඳ පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වන්නේ ද?

(*a*) වායුගෝල පීඩනය යටතේ නයිට්‍රජන් ජලයේ සුළු වශයෙන් දියවන අතර නයිට්‍රජන්වල ජලයේ ද්‍රාව්‍යතාව පීඩනයත් සමග වැඩි වේ.

(*b*) සංයෝගවල නයිට්‍රජන් −3 සිට +5 දක්වා ඔක්සිකරණ අංක පෙන්වයි.

(*c*) නයිට්‍රජන්හට බහුරූපී ආකාර කිහිපයක් තිබේ.

(*d*) අකුණු ගැසීමේදී වායුගෝලීය නයිට්‍රජන්, $NH_3$ බවට පරිවර්තනය වේ.

**35.** 25 °C දී පහත අර්ධ ප්‍රතික්‍රියා සලකන්න.

$$Ag^{+}(aq) + e \longrightarrow Ag(s) \quad : E^\circ = +0.80\ V$$
$$Cu^{2+}(aq) + 2e \longrightarrow Cu(s) \quad : E^\circ = +0.34\ V$$
$$Zn^{2+}(aq) + 2e \longrightarrow Zn(s) \quad : E^\circ = -0.76\ V$$

පහත සඳහන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේ ද?

(*a*) $CuSO_4(aq)$ ද්‍රාවණයක් තුළ Zn(s) ලෝහ දණ්ඩක් තැබූ විට Cu(s) ලෝහය Zn(s) දණ්ඩ මත තැන්පත් වේ.

(*b*) ඉහත නියෝජනය කරන අර්ධකෝෂවලින් ගොඩනැගිය හැකි විද්‍යුත් රසායනික කෝෂ අතුරෙන් $Zn(s)\,|\,Zn^{2+}(aq)\,||\,Ag^{+}(aq)\,|\,Ag(s)$ට වැඩිම වි.ගා.බ. අගය ඇත.

(*c*) $CuSO_4(aq)$ ද්‍රාවණයක් තුළ Ag(s) ලෝහ දණ්ඩක් තැබූ විට Cu(s) ලෝහය Ag(s) දණ්ඩ මත තැන්පත් වේ.

(*d*) 0.50 mol $dm^{-3}$ $H_2SO_4(aq)$ අම්ල ද්‍රාවණයකට Cu(s), එකතු කළ විට, $H_2(g)$ පිට නොවේ.

**36.** වියළි ඊතර හි ඇති Mg සමග ප්‍රතික්‍රියා කළ විට, පහත දක්වා ඇති සංයෝග අතුරෙන් කුමක්/කුමන ඒවා අවසාන ඵලය ලෙස ග්‍රීනාඩ් ප්‍රතිකාරකයක් **නොසාදයි** ද?

(*a*) $CH_3C(=O)CH_2CH_2Br$ (b) $CH_3CH(NH_2)CH_2CH_2Cl$

(*c*) $CH_3C{\equiv}C{-}H$ (d) $BrCH_2CH{=}CH_2$

**37.** ගෘහස්ථ ශීතකරණවල ශීතකාරකය ලෙස ඩයික්ලෝරොඩයිෆ්ලෝරොමීතේන් (R-12) භාවිත කරයි. නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ හඳුනාගන්න.

(*a*) වාෂ්පශීලී R-12 සංයෝගය නිදහස් වූ විට ස්ට්‍රැටෝ ගෝලය කරා ළඟා වීමට ඉහළ හැකියාවක් ඇත.

(*b*) පරිවර්ති ගෝලයේදී R-12 ස්ථායී වුවත් ස්ට්‍රැටෝ ගෝලයේදී එය වියෝජනය වී ක්ලෝරීන් මුක්ත ඛණ්ඩක සාදයි.

(*c*) හරිතාගාර වායුවක් වන R-12 ගෝලීය උණුසුම ඉහළ යෑමට දායක වේ.

(*d*) ප්‍රකාශ රසායන ධූමිකාවෙන් සෑදුණු ඕසෝන් ක්ෂය කිරීම R-12 මගින් සිදු කරයි.

**38.** දී ඇති උෂ්ණත්වයක පරිමාව 1.0 $dm^3$ වන දෘඪ-සංවෘත බඳුනක පුරවා ඇති තාත්වික වායුවක පීඩනය, සම ප්‍රමාණයක පරිපූර්ණ වායුවක් සඳහා ගණනය කළ පීඩනයට වඩා අඩු ය. පහත සඳහන් කුමන වගන්තිය/වගන්ති මෙම අතාත්වික හැසිරීමේ නිරීක්ෂණය සඳහා වලංගු හේතු ලබා **නොදෙයි** ද?

(*a*) බඳුනෙහි පරිමාව සමග සන්සන්දනය කළ විට, තාත්වික වායු අණුවල පරිමාව නොසලකා හැරිය නොහැක.

(*b*) තාත්වික වායු අණුවල ප්‍රවේගයන් පරිපූර්ණ වායු අණුවල ප්‍රවේගයන්වලට වඩා අඩු ය.

(*c*) තාත්වික වායු අණු එකිනෙකට ආකර්ෂණය වන බැවින් ඒවා බඳුනෙහි බිත්ති මත පරිපූර්ණ වායුවක් මගින් ඇති කරන බලයට සමාන වන බලයක් ඇති නොකරයි.

(*d*) තාත්වික වායු අණු බඳුනෙහි බිත්ති දෙසට ආකර්ෂණය වේ.

**39.** පහත කාර්මික ක්‍රියාවලි අතුරෙන් කුමක්/කුමන ඒවා ප්‍රතිවාහ මූලධර්මය භාවිත කරයි ද?

(*a*) පටල කෝෂ ක්‍රමය මගින් NaOH නිෂ්පාදනය

(*b*) ධාරා ඌෂ්මකයක් මගින් Fe නිස්සාරණය

(*c*) ස්පර්ශ ක්‍රමය මගින් $H_2SO_4$ නිෂ්පාදනය




(*d*) හේබර්-බොෂ් ක්‍රමය මගින් $NH_3$ නිෂ්පාදනය

[නවවැනි පිටුව බලන්න.

**40.** සල්ෆර්වල ඔක්සෝඅම්ල පිළිබඳව සත්‍ය වන්නේ පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ ද?
(*a*) සාන්ද්‍ර සල්ෆියුරික් අම්ලයට විජලකාරකයක් ලෙස ක්‍රියා කළ හැක.
(*b*) ජලය සමග $SO_2(g)$ ප්‍රතික්‍රියාව සල්ෆියුරික් අම්ලය නිපදවයි.
(*c*) සමහර ලෝහ සහ අලෝහ සමග උණු සාන්ද්‍ර සල්ෆියුරික් අම්ලයට ඔක්සිකාරකයක් ලෙස ප්‍රතික්‍රියා කළ හැකි ය.
(*d*) $H_2SO_4$ සහ $H_2SO_3$ යන දෙකෙහිම ව්‍යුහවල $S=O$ බන්ධන දෙක බැගින් අඩංගු ය.

- ප්‍රශ්න අංක **41** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා ප්‍රකාශ දෙක බැගින් ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශ යුගලයට **හොඳින්ම** ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන පරිදි (1), (2), (3), (4) සහ (5) යන ප්‍රතිචාරවලින් කවර ප්‍රතිචාරය දැ'යි තෝරා පිළිතුරු පත්‍රයෙහි උචිත ලෙස ලකුණු කරන්න.

| ප්‍රතිචාරය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය වේ. | සත්‍ය වන අතර, පළමුවැනි ප්‍රකාශය නිවැරදිව පහදා දෙයි. |
| (2) | සත්‍ය වේ. | සත්‍ය වන නමුත් පළමුවැනි ප්‍රකාශය නිවැරදිව පහදා **නොදෙයි.** |
| (3) | සත්‍ය වේ. | අසත්‍ය වේ. |
| (4) | අසත්‍ය වේ. | සත්‍ය වේ. |
| (5) | අසත්‍ය වේ. | අසත්‍ය වේ. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **41.** | බෙන්සීන් $Cl_2$ සමග $FeCl_3$ හමුවේ ප්‍රතික්‍රියා කර  ලබාදෙයි. | $Cl_2$, $FeCl_3$ සමග ප්‍රතික්‍රියා කර සෑදෙන $Cl^+$ ඉලෙක්ට්‍රෝෆයිලය ඉලෙක්ට්‍රෝන බහුල බෙන්සීන් වලය සමග ප්‍රතික්‍රියා කරයි. |
| **42.** | *s*-ගොනුවේ මූලද්‍රව්‍ය මෙන් නොව *p*-ගොනුවේ මූලද්‍රව්‍ය පහන්සිළු පරීක්ෂණයේදී ඔක්සිකාරක දැල්ලට ලාක්ෂණික වර්ණයක් ලබා **නොදෙයි.** | ආවර්තිතා වගුවේ 2 හා 3 ආවර්තවල *p*-ගොනුවේ සියලුම මූලද්‍රව්‍යවල ප්‍රථම අයනීකරණ ශක්තීන් අනුරූප ආවර්තවලම ඇති *s*-ගොනුවේ මූලද්‍රව්‍යවල අගයන්ට වඩා වැඩි වේ. |
| **43.** | $H_2O(s) \rightleftharpoons H_2O(l)$ තාප අවශෝෂක ක්‍රියාවලියකි. | අයිස් දියවීමේ ක්‍රියාවලිය ඉහළ උෂ්ණත්වය හා ඉහළ පීඩන මගින් පහසු කරයි. |
| **44.** | ඕසෝන් රබර්වල යාන්ත්‍රික ශක්තිය අඩු කරයි. | රබර්වල ඇති ද්විත්ව බන්ධන සමග ඕසෝන් ප්‍රතික්‍රියා කරයි. |
| **45.** | $ICl_2^-$, $N_3^-$ සහ $BeCl_2$ වල මධ්‍ය පරමාණුවල සංයුජතා කවච ඉලෙක්ට්‍රෝන යුගල ගණන එකිනෙකින් වෙනස් වුවත් ඒවාට එකම හැඩයක් ඇත. | අණු සහ අයනවල මධ්‍ය පරමාණුව මත ඇති එකසර ඉලෙක්ට්‍රෝන යුගල් එකිනෙක විකර්ෂණය අවම කිරීමට එකිනෙකට හැකිතාක් දුරින් පිහිටයි. |
| **46.** | ද්‍රව ජලය අයිස් බවට ඝනීභවනය වීමේ එන්ට්‍රොපි වෙනස, අයිස් ඌර්ධ්වපාතනය වීමේ එන්ට්‍රොපි වෙනසට වඩා වැඩි ය. | ද්‍රව සහ වායු සමග සන්සන්දනයේදී ඝනයන්හි එන්ට්‍රොපිය අඩු ය. |
| **47.** | දී ඇති උෂ්ණත්වයකදී $HNO_3(aq)$ ද්‍රාවණයක් තුළ $Ag_2C_2O_4(s)$ හි මවුලික ද්‍රාව්‍යතාවය, ආස්‍රැත ජලය තුළ එහි මවුලික ද්‍රාව්‍යතාවයට වඩා වැඩි ය. | තනුක අම්ලයක් හමුවේ $C_2O_4^{2-}(aq)$ අයන, $HC_2O_4^-(aq)$ අයන සහ/හෝ $H_2C_2O_4(aq)$ බවට පත් වේ. |
| **48.** |  සහ  සංයෝග පාරත්‍රිමාන සමාවයවික වේ. | එකිනෙකෙහි දර්පණ ප්‍රතිබිම්බ **නොවන** ඕනෑම සංයෝග දෙකක් පාරත්‍රිමාන සමාවයවික වේ. |
| **49.** | පොලිඑතිලීන් ආකලන බහුඅවයවිකයක් ලෙස වර්ගීකරණය කෙරේ. | එතිලීන්හි ද්විත්ව බන්ධන එහි ප්‍රතික්‍රියාවලට හේතු වේ. |
| **50.** | සාන්ද්‍ර නයිට්‍රික් අම්ලය විද්‍යාගාරවල දුඹුරු වීදුරු බෝතල්වල ගබඩා කරයි. | නයිට්‍රික් අම්ලය ආලෝකය හමුවේ නයිට්‍රජන් ඩයොක්සයිඩ් බවට වියෝජනය වේ. |

***